**B**

# නිවේදනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, **"ආයුර්වේද (සංශෝධන)"** නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලදුව, 2023 ජුලි 07 වන දින ම'විසින් නිවේදනය කරන ලද පෙත්සමට අමතරව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් පහක පිටපත් ද, **"ප්‍රාදේශීය සභා (සංශෝධන)", "නගර සභා (සංශෝධන)"** සහ **"මහ නගර සභා (සංශෝධන)"** නමැති පනත් කෙටුම්පත් තුන සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් පෙත්සම් පහ බැගින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම්වල පිටපත් ද මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.